පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). සමාලෝචිත වර්ෂයෙ මිලදීගෙන තිබූ කාබනික පොහොර හලනයේ වටිනාකම වූ රු.110,000 ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.180,000 ක් වූ කොම්පෝස්ට් බැරල් 150 ක් ද, රු.169,740 ක් වටිනා මත්ස්‍ය අලෙවි කුටි 09 ක් ද අවසන් තොග යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට ආදාහනාගාරයේ ඉතිරිව තිබූ රු.45,384 ක් වටිනා ගෑස් කි.ග්‍රෑ.277 ක් ගිණුම් වලින් අනාවරණය කර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුල සභාවට පවරාගෙන තිබූ රු.1,188,000 ක් වටිනා ඉඩම් , ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූරණ යටතේ ලැබී තිබූ රු.23,100,447 ක ප්‍රමාණය අදාල වැඩසටහන් අනුව වෙන් කිරීමක් නොකර වැඩසටහන් අංක 01 පොදු පර්පාලනය යටතේ ගිණුම් ගතකර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 17 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු63,056,555 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගණුම් ශේෂයන්ගේ එකතුව රු.63,178,298 ක් විය.

1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ගිණුම් විෂයයන් (පොදු සැපයුම් ණයහිමියෝ සහ පුස්තකාල පොත්) 2 කට අදාලව පැහැදිලි නොකල රු. 634,704 ක ශේෂයක් පැවතුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂවල වටිනාකම රු.37,521,522 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.22,596,661 ක් ව අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.4,301,910 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). පළාත් මූල්‍ය රීති 274 අනුව චෙක්පත් මගින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා තම මුදල් ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බලා ශේෂය ප්‍රමාණවත් වේ නම් පමණක් චෙක්පත් අත්සන් කළයුතු වුවත්, එකී නියමයට පටහැනිව කටයුතු කිරීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ මැයි මාසයේදී එක් බැංකු ගිණුමකට අදාලව මුදල් පොත අනුව රු.464,344 ක අයිරා ශේෂයක් පැවතුන අතර බැංකු ගිණුමකට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට නකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවු රු.39,869 වටිනා චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ). 2006 - 2008 කාල පරිච්ඡේදය සඳහා අවස්ථා 03 ක් යටතේ තැන්පත් කරන ලද රු.66,475 ක මුදලක් සමාලොචිත වර්ෂය දක්වාම නිරවුල් නොකර තැන්පත් යටතේ පැවතුණි.

2.3 ආදායම් පර්පාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 4,404 | 3,622 | 5,561 | 4,289 | 1,873 | 4,772 |
| (ii) | බදුකුලී | 469 | 3,573 | 3,079 | 3,301 | 294 | 1,930 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,342 | 1,344 | - | 1,217 | 1,214 | 2 |
| (iv) | වෙනත් ආදායම් | 51 | 25 | 322 | 58 | 34 | 305 |
| | | 6,266 | 8,564 | 8,962 | 8,865 | 3,415 | 7,009 |

2.3.2 උසාවි දඩ මුදල්

සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

අයවිය යුතු මුදල ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3.4 කඩ බදු

දීර්ඝ කාලීනව බදුදීම් යටතේ සභාව විසින් නිසි පරිදි කුලී අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කාල පරිච්ඡේදය තුල අවස්ථා 54 කට අදාලව රු.1,258,063 ක හිඟ කඩකුලී ශේෂයක් පැවතුනි. එයින් අවස්ථා 03 ක් යටතේ පැවති රු.326,850 ක හිඟ අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි. "2010 නොවැම්බර් 30 දිනට පෙර අනෙකුත් හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව" 2010 ඔක්තෝබර් 01 දින සභාපතිවරයා මා වෙත දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද එපරිදි කටයුතු කර ඇති බවක් අනාවරණය නොවුණි.

2.3.5 වත්කම් බදුදීම

වාර්ෂික බදුදීම් යටතේ සභාවේ වත්කම් බදුදීමේදී 1998 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වන කාල පරිච්ඡේදය තුල සභාව විසින් නිසි පරිදි කුලී අයකර ගැනීමට කටයුතු නොකිරීම මත අවස්ථා 30 කට අදාලව සමාලෝචිත වර්ෂයයේ අවසානයට එම කාලයට අදාලව රු.1,478,910 ක මුදලක් හිඟව පැවතුනි. එයින් රු.633,696 ක් වටිනා අවස්ථා 09 කට අදාලව හිඟ අයකර ගැනීම සඳහා නඩු පවරා තිබූණි. '2010 දෙසැම්බර් 15 දිනට පෙර හිඟ අයකර ගැනීමට කටයුතු කරන බවත් එසේ අයකර ගැනීමට නොහැකි වුවහොත් දෙසැම්බර් 31 දිනට පෙර සියළුම හිඟ අයකර ගැනීම සඳහා නඩු පවරන බව' සභාපතිවරයා 2010 ඔක්තෝබර් 01 දින මා වෙත දන්වා තිබුණද එපරිදි කටයුතු කර ඇති බවක් අනාවරණය නොවුණි.

2.3.6 ගොඩවෙල සතිපොල බදු

සමාලෝචිත වර්ෂයට අදාලව ගොඩවෙල සතිපොල රු.554,150 කට බදු දී ඇති අතර, බදුකරු විසින් නියමිත පරිදි බදුකුලී නොගෙවීම මත ඇප හිලව් කල පසුවද රු.181,939 ක කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟව පැවතුනි. එමෙන්ම අදාල බදු ගිවිසුමේ 25 වෙනි වගන්තිය අනුව සතිපොල විදුලි බිල්පත් නිරවුල් කිරීම බදුකරු විසින් කළයුතු වුවද, බදුකරු එසේ

නොකිරීම මත විදුලිය විසන්ධි කිරීම හේතුවෙන් අවස්ථා දෙකකදී ඔහුගේ ඇප මුදලින් රු.15,729 ක් නැවත විදුලිය සන්ධි කිරීමේ ගාස්තු ලෙස සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි.

2.3.7 වරිපනම් බදු

සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ වරිපනම් හිඟය රු.2,150,823 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයට අදාල බිල් කිරීම් වූ රු.438,283 හා සැසදීමේදී වර්ෂ 05 බිල් කිරීම් වලට ආසන්න අගයක් ව පැවතුණි. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති සහ1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 33 සිට 41 රීති නියමයන් අනුව අදාල හිඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 42,290 | 35,178 | 7,112 | 41,085 | 33,559 | 7,526 |
| අනෙකුත් | 12,422 | 12,117 | 305 | 16,830 | 14,727 | 2,103 |
| උප එකතුව | 54,712 | 47,295 | 7,417 | 57,915 | 48,286 | 9,629 |
| ප්‍රාග්ධන වියදම | 6,700 | 13,320 | (6,620) | 12,250 | 13,887 | (1,637) |
| මුළු එකතුව | 61,412 | 60,615 | 797 | 70,165 | 62,173 | 7,992 |

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 02 |
| ද්විතීයික | 28 | 25 |
| ප්‍රාථමික | 99 | 74 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 72 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක වටිනාකම රු.54,125,225 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.37,916,218 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය

----------------------------

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.106,900 ක් විය.

2.6.3 අචල ජංගම වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 03 ට වැඩි කාලයක සිට පවතින අභාවිත තොග රු.154,670 ක් ද ණය ගැති ශේෂ රු.275,687 ක් ද විය.

2.7 ආර්ථික නොවූ ගණුදෙනු

1980 වර්ෂයේ පොල්ගහවෙල මධ්‍ය විද්‍යාල පාර පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනිමට අදාල වන්දි මුදල් තැන්පත් කිරීම පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). 1980 වර්ෂයේ ආරම්භ කර තිබූ මෙම ක්‍රියාවලියට අදාලව 1984 අප්‍රේල් 02 දින කුරුණෑගල දිසා අධිකරණයේ තීන්දුව පරිදි ඉඩම් ලාභීන්ට වන්දි ගෙවා ගොඩනැගිලි කඩා ඉවත් කර පාර පුළුල් කිරීමට තීරණය දී තිබුණි. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගේ 1984 පෙබරවාර් 27 දිනැති වාර්තාව අනුව ඉඩම් කැබලි 02 ක් සඳහා වූ තක්සේරු වටිනාකම රු.100,000 ක් 1985 ජනවාර් 01 දින කුරුණෑගල දිසාපති වෙත තැන්පත් කර තිබූ අතර 1987 ජූනි 29 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව අදාල ඉඩම් රජය සතු කර පවරා ගෙන ඇත.

(ආ). 2002 වර්ෂය දක්වාම ඉඩම් ලාභීන් වෙත වන්දි ගෙවීම් හෝ අදාල කාර්ය ඉටු කිරීම සිදුව නොතිබූ අතර නැවත 2002 මැයි 02 දිනැති පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් ගේ ලිපිය අනුව කැබලි 03 ක් ලෙස නැවත තක්සේරුවක් ඉල්ලා තිබූ අතර ඒ අනුව ප්‍රධාන තක්සේරුකරුගේ 2005 අප්‍රේල් 12 දිනැති වාර්තාව අනුව කැබලි 03 ක් ලෙස රු.796,000 කට නැවත තක්සේරු කර තිබුණි. 2002 මැයි 31 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අදාල ඉඩම නැවත රජය සතුකර පවරා ගෙන ඇත.

(ඇ). 2008 වර්ෂය දක්වාම වන්දි ගෙවීම හෝ අදාල කාර්ය ඉටුකිරීම සිදුව නොතිබූ අතර, 2008 ජූනි 29 දිනැති පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව අනුව, දෙවන තක්සේරුව අනුව වූ තක්සේරු වටිනාකම වූ රු.796,000 සහ ඉඩම පවරා ගත් 1987 ජූනි 29 සිට 2008 ජූනි 29 දක්වා පොලිය ලෙස රු.1,170,120 ක් ලෙස එකතු වටිනාකම රු.1,966,120 ක මුදලක් මෙකී ඉඩම් පවරා ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය බව සඳහන් කර තිබුණි.

(ඈ). 2009 දක්වාම ඉහත 'ඇ' පරිදි ද ක්‍රියාකර නොතිබූ අතර 2009 මාර්තු 02 දිනැති පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව අනුව, නැවත එදින දක්වා ගෙවිය යුතු මුළු මුදල ලෙස රු.2,003,368 ක් ඉඩම පවරා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය බව දක්වා තිබුණි. ඒ අනුව 1984

වර්ෂයේ තැන්පත් කල රු.100,000 මුදල හිලව් කර රු.1,903,368 ක මුදලක් 2009 මැයි 14 දින පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් වෙත ප්‍රාදේශීය සභාව විසින් තැන්පත් කර තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය අවසන් වනතුරු වන්දි මුදල් ගෙවීමක් හෝ අදාල කාර්යය ඉටු කිරීමක් සිදුව නොතිබූ අතර නියමිත කාල වකවානු අනුව අදාල කාර්යයන් සිදු නොකිරීම නිසා සභාවට අතිරේකව පහත පරිදි රු.1,903,368 ක් වැය කිරීමට සිදුව තිබුණි.

| කාර්යය | අතිරේකව දැරීමට සිදුවූ මුදල |
|---|---|
| | රු. |
| 1984 තක්සේරු වටිනාකම අනුව කටයුතු නොකර 2002 තක්සේරු වටිනාකම පදනම් කර ගැනීම | 696,000 |
| 1987 ජූලි සිට ඉඩම පවරා ගෙන තිබුණද වන්දි මුදල් නොගෙවීම නිසා ගෙවීමට සිදුවූ පොළිය | 1,207,368 |
| | 1,903,368 |

2.8 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 7,427,835 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු.15,611 බැගින් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

2.9 <u>කාර්ය සාධනය</u>

(අ) සමාලෝචිත වර්ෂය තුල වීරඹුගෙදර ළමා උද්‍යානය ඉදිකිරීම සඳහා රු.ලක්ෂ 10 ක ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එකී ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි

(ආ). ජාතික සවිය ගම නැගුම යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.14,263,829 ක් වූ ව්‍යාපෘති 49 ක වැඩ අර්ධ වශයෙන් නිමකර තිබුණි.

(ඇ). මගනැගුම යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.2,800,000 ක් වු ව්‍යාපෘති 06 ක් නිමකර නොතිබුණි.

2.10 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය